දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ–மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.

இசுருபாயா
பத்தரமுல்ல.

"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. } ඊඩී/01/26/2/16/01 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපන ශාඛාව

දිනය / திகதி / Date } 2006.09.22

චක්‍ර ලේඛ අංකය : 2006/35

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පාසල් ප්‍රධානීන් වෙත,

## අ.පො.ස (සාමාන්‍ය පෙළ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (O/L - ICT) විභාග ප්‍රශ්න පත්‍රයේ භාෂා මාධ්‍යය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන රාමුව තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය ඉගැන්වීමේ දී හා විභාග පැවැත්වීමේ දී භාෂා මාධ්‍යය පිළිබඳ ව හැඳින්වීම මෙම චක්‍ර ලේඛයේ මූලික අරමුණ වේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අධ්‍යාපනය සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කර ඇති 2005.04.29 දිනැති අංක 2005/16 දරණ චක්‍ර ලේඛයට අදාළ ව නිකුත් කර ඇති ED/03/38/2/16/01 හා 2005.05.31 දිනැති උපදෙස් පත්‍රිකාවේ සඳහන් "අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගයේ දී මෙම විෂයය සඳහා ප්‍රශ්න පත්‍රය ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා දෙනු ඇත" යන වගන්තිය මෙම චක්‍ර ලේඛය මගින් පහත දක්වා ඇති පරිදි සංශෝධනය කෙරේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය අ.පො.ස. සාමාන්‍ය පෙළ විෂය මාලාව තුළ තාක්ෂණික විෂයයක් වශයෙන් (O/L - ICT) මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. එමෙන් ම උසස් පෙළ සිසුන් සඳහා ද සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය (GIT) හඳුන්වා දී ඇත.

2007 වසරේ සිට ආරම්භ කිරීමට යෝජිත සාමාන්‍ය පෙළ තොරතුරු තාක්ෂණ විෂයය ප්‍රශ්න පත්‍රය සෑම අපේක්ෂකයකුට ම තම මව් භාෂාවෙන් හා ඉංග්‍රීසි භාෂාවෙන් ලබා දෙනු ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ

විෂයය සාමාන්‍ය විෂයයන්ගෙන් වෙනස් වූ තාක්ෂණික විෂයයකි. මෙහි පාරිභාෂිත වචන සිංහල හෝ දෙමළ හෝ භාෂාවකට පරිවර්තනය කිරීමේ දී ගැටළු මතුවන බැවින් ඉංග්‍රීසි භාෂාවෙන් ද පැහැදිලි කිරීමක් ලබා දීම මෙසේ මාධ්‍ය දෙකකින් ලබා දීමේ මූලික අරමුණ වේ. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන අපේක්ෂකයාගේ ප්‍රධාන භාෂා මාධ්‍යය අනුව ප්‍රතිඵල ලබා දීමට විභාග දෙපාර්තමේන්තුව එකඟතාව පළ කර ඇත. (උදා : අපේක්ෂකයාගේ ප්‍රධාන භාෂා මාධ්‍යය සිංහල නම් ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයුව ද ප්‍රතිඵල නිකුත් කිරීම සිදුවන්නේ සිංහල මාධ්‍ය විෂයයක් වශයෙනි.)

අ.පො.ස. සාමාන්‍ය පෙළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයයේ භාෂා මාධ්‍ය පිළිබඳ තීරණයන්හි දී මෙම චක්‍ර ලේඛයේ උපදෙස් පිළිපදින ලෙස මෙයින් දන්වමි.

ආරියරත්න හේවගේ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යංශය

පිටපත්

- විභාග කොමසාරිස් ජනරාල්
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්පත් මධ්‍යස්ථාන භාරකරුවන්